# ප්‍රශ්න සහ පිළිතුරු: බින්ඩීස් පබළු (Bindeez ™ beads) සමග මිශ්‍රවීම

**බින්ඩීස් බීඩ්ස් වල ඇති ගැටළුව කුමක්ද?**

පෙනෙන ආකාරයට පබළු සෑදීමට ආරක්ෂාකාරී රසායනික ද්‍රව්‍යයක් වෙනුවට විෂ සහිත රසායනික ද්‍රව්‍යයක් භාවිතා කර ඇත. මෙම රසායනික ද්‍රව්‍යය ගිලුනු විට සිරුර තුල GHB බවට පත්වේ.

## GHB යනු කුමක්ද?

GHB (ගැමා හයිඩ්‍රොක්සි බියුටිරේට් - gamma hydroxy butyrate) යනු ප්‍රබල ලෙස සමනය කරන සහ නිර්වින්දනය කරන ද්‍රව්‍යයකි.

## GHB වල බලපෑමට ලක්වූ දරුවකුගේ ලක්ෂණ මොනවාද?

ගිලුණු පබළු ගණන අනුව ලක්ෂණ වෙනස්වේ.

සුළු වශයෙන් මෙහි බලපෑමට ලක්වූ දරුවකු මඳ වශයෙන් නිදිමත ගතිය හෝ අක්‍රිය ගතියක් පෙන්විය හැක. වැඩි වශයෙන් මෙහි බලපෑමට ලක්වූ දරුවන් තුල ඔක්කාරය, වමනය, නිදිමත ගතිය, කථාව අපහසුවීම, තදබල ලෙස නිදිමත ගතිය හෝ අපස්මාර වලිප්පුව ඇතිවිය හැක.

සියළු රෝග ලක්ෂණ පැය කිහිපයක් ඇතුලතදි අවසන් වීම සිදුවේ.

## GHB වල බලපෑම ඇති බවට ලක්ෂණ මාගේ දරුවා පෙන්වයි නම් මා කුමක් කල යුතුද?

සුළු වශයෙන් මෙහි බලපෑමට ලක්වූ දරුවන්ව ඔබගේ පවුලේ වෛද්‍යවරයා හෝ පළාතේ රෝහල වෙත රැගෙන යන්න. වඩා දරුණු ලඑණ පෙන්වයි නම්, ගිලන් රථයක් කැඳවන්න.

දෙමාපියන් විසින් දරුවන්ව වමනය කිරීමට උනන්දු නොකල යුතුය.

**දරුවකු බින්ඩීස් බීඩ්ස් සමග ක්‍රීඩා කරමින් සිටිනම් කුමක් කල යුතුද?**

දෙමාපියන් විසින් දරුවන් ලග ඇති පබළු ඉවත් කර ඔවුන්ට හසු නොවන තැනක තිබිය යුතුය. පබළු ගිලී නොමැති සහ නිදිමත හෝ ඔක්කාර ලක්ෂණ නොමැති දරුවන් මෙහි බලපෑමට ලක්වී සිටිය නොහැක. මෙම දරුවන් නිවසේ තබාගෙන රෝග ලක්ෂණ ඇතිවේද යන්න බැලිය හැක. පැයක් ඇතුලත රෝග ලක්ෂණ ඇති නොවේ නම්, ඔවුන් මෙහි බලපෑමට ලක්වී සිටිය නොහැක.

පබළු හෝ පබළු සහිත ක්‍රීඩා භාණ්ඩ ඇල්ලූ පමණින් සිරුරට කිසිදු බලපෑමක් ඇතිවන බවට විශ්වාස නොකෙරේ.

**බින්ඩීස් බීඩ්ස්වලට කුමක් කල යුතුද?**

බින්ඩීස් බීඩ්ස් ළමුන්ගෙන් ඉවත්කල යුතු අතර ඔවුන්ට හසු නොවන තැනක තිබිය යුතුය. බෙදාහරින්නාගේ වෙබ් අඩවිය වන: http://www.mooseworld.com.au/content/bindeezrecall/faq.aspx හි ඇති උපදෙස් අනුව මේවා දෙමාපියන් විසින් හැකි විගස ඔවුන් වෙත භාරදිය යුතුය නැතිනම් මූස් එන්ටර්ප්‍රයිසස් (Moose Enterprises) වෙත අංක 1800 303 895 ඔස්සේ දුරකථනයෙන් ඇමතීම මගින් මෙය කල හැක.

සෞඛ්‍යයට ඇතිවන බලපෑම් ගැන වැඩි විස්තර ලබා ගැනීම සඳහා කරුණාකර අංක 131 126 ඔස්සේ විෂ තොරතුරු මධ්‍යස්ථානය (**Poisons Information Centre**) අමතන්න නැතිනම් ඔබ පළාතේ මහජන සෞඛ්‍යය ඒකකය අමතන්න:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කැම්පර්ඩවුන් | 02 9515 9420 | පෙන්රිත් | 02 4734 2022 | බ්‍රෝකන් හිල් | 08 8080 1499 | නිව් කාසල් | 02 4924 6477 |
| ගොස්ෆර්ඩ් | 02 4349 4845 | රැන්ඩ්වික් | 02 9382 8333 | ඩබෝ | 02 6841 5569 | පෝර්ට් මැක්වාරි | 02 6588 2750 |
| හෝන්ස්බි | 02 9477 9400 | ඕල්බරි | 02 6080 8900 | ගෝල්බරන් | 02 4824 1837 | ටැම්වරත් | 02 6767 8630 |
| පැරමටා | 02 9840 3603 | බැතර්ස්ට් | 02 6339 5601 | ලිස්මෝර | 02 6620 7500 | වොලොන්ගොන්ග් | 02 4221 6700 |

**හදිසි වෛද්‍ය උපකාර සඳහා අංක 000 අමතන්න**